# සසංකාර කෙරෙන් විද්‍යාමාන සංසාරික සංතෘෂ්ටිය

ඩී. පී. අයි. එල්. ප්‍රසංගිකා

කුමාර සිරිවර්ධනයන් විසින් විරචිත සංස්කාරයන් සහිතව සත්‍ය සොයමින් කාලත්‍රයේ සංචාරය කරන රූප පරම්පරා පිළිබඳ කතාව"සසංකාර" තුළින් උද්දීපනය වන විශ්‍රාන්තිය වනාහි ලෞකික, ලෝකෝත්තර සුවයන්ගේ ශ්‍රද්ධා මූලික විශ්‍රාන්තිය මෙන්ම අනෙකුත් විශ්‍රාන්ති රටා ද ස්පර්ශ කරනුයේ කාල කුල භේදයකින් තොරවය.

මිතුරු සමාගමට වඩා හුදෙකලාව ප්‍රිය කළ අයශිව කුමරු මහා මේඝ උයන හරහා නිවී හැනහිල්ලේ ඇවිද ආවේය. දිනක් තිසා වැව් ඉවුරේ ඇවිද යමින් සිටි අයශිව කුමරු දුටුවේ තම මව කොහොඹ ගස් සෙවණක හිඳගෙන බැස යන හිරු එළියෙන් තැඹිලි පැහැයෙන් දිලිසුණු තිසා වැවේ නැගෙන වැටෙන දිය රැලි දෙස බලාගෙන සිටින ආකාරයකි. ඇගේ පරිවාර ස්ත්‍රීන් දෙදෙන දණක් පමණ උසට වැව් දියට බැස කෙළි දෙළෙන් පසු වූහ. සෙවණ සැලසූ දැවැන්ත වෘක්ෂයන්, සුළඟේ රිද්මයට සැලෙමින් පරිසරය පුරා සිසිලස බෙදා හළ මලින් පිරී ගත් තුරු ලතා, විවිධ ඖෂධීය ශාක හා පැළෑටි, තැන තැන වූ සුනිල දියෙන් සපිරි පොකුණු, තුරු ලතා අතර හිඳ අපූරු සංධ්වනියක් පරිසරයට දායාද කළ නෙක පැහැ පක්ෂීන්, ඒ සංධ්වනියේ අපූර්වත්වය අවුල් නොකොට ඊටම ගැළපෙන සුන්දර සුසංයෝගයක් මැවූ බිගුන්ගේ ගුමු ගුමුව, එකා පසු පස එකා හඹා යමින් සිටි සමනල රැන් ඇතුලු මහා මේඝ වනයේ පරිසරය පිළිබඳ අයශිව කුමරු සවිඥානකව සිටියේය. කාශ්‍යප මුනින්ද්‍රයාණන්ගේ ශාසනය පැවති අවධියේ මහා සාගර උයන මෙකල්හී අනුරපුර ආශ්‍රිතයේ වූ මහා මේඝ උයන හරහා කුමරු පියමනිමින් සිටියේ අරමුණකින් තොරව නම් නොවේ. ගෙවී ගිය වෙසඟ පුනු පොහෝ දින විසා නැකතින් සත් රියනක් ගැඹුරට තලච්ච සඳහා වළ සෑරීම ඇරඹූ දා පටන් විවේකි වේලාවන් හි දී එතැනට යාම අයශිව කුමරු පුරුද්දක් කරගෙන සිටියේය. බොහෝ සන්ධ්‍යාවන් හී ඔහු එතැනට (ජය ශ්‍රී මහ බෝ සමිඳු සෙවණට) ගොස් වැලි මලුව මත බද්ද පර්යංකයෙන් හිඳිමින් මෛත්‍රී භාවනාව හෝ බුද්ධානුස්මෘති භාවනාව හෝ වැඩුවේය. ඔහු වඩාත් ප්‍රිය කළේ හුදෙකලාවටය. හෙතෙම සම වයසේ අනෙක් දරුවන් කෙළි දෙළෙන් මහා මේඝ උයනේ තැන තැන දුව පැන ඇවිදිද්දී ඔවුන්ගෙන් වෙන් ව තිසා වැව ඉවුරට වී එහි දිය රැළි නැගෙන වැටෙන ආකාරය දෙස බලා සිටියේය. එහෙත් ජය ශ්‍රී මහා බෝධී වන්දනාවේ යෙදී සිටි උවසු උවැසියන් අතර පැවතියේ සන්සුන් හා සංවර බවකි. "මා ද තවම වන්දනාමාන කළේ නැහැ අක්කණ්ඩි....." "මහ රජතුමා සුපුරුදු පරිදි පහන් දොර අවධිව භාවනා කිරීමෙන් පසු මා කැඳවා ඔබ තුමාව කැඳවාගෙන එන්නැයි අණ දෙද්දී එතුමාගේ මුහුණේ වූයේ සෑම උදෑසනකම මෙන් සෞම්‍ය බවක්." මහා රජතුමා මෙන් ම මාලිගයේ බොහෝ දෙනා ද හිමිදිරියේ ම ශ්‍රී මහා බෝධීය වන්දනා කරමින් සිටි අතර..... බැස යන හිරු රැසින් දිලිසෙන වැව් ජලය මත ඒ මේ අත පිහිනමින් සිටි ධෘෂ්ඨ ගාමිණී රජු..... කුමරු දුටුවේ පසෙක උද්‍යානයේ වසන්ත මණ්ඩපය ආසන්නයේ කෙහෙවලිය මුදාහැර ඒ මේ අත සක්මන් කරමින් සිටි සිය පිය රජුය. ඇතුළු නුවර දොරටුවෙන් පිටවූ කුමරු හැල්මේ අසු මෙහෙයවූයේය..... නන්දන උයන පසුකොට හෙතෙම ගමන් කළේ මහා මේඝ උයන හරහා මහා ස්ථූපය වෙතය. මහ සෑ මළුවට පිවිස ළවැලි මත දෙදන එබූ අයශිව කුමරු තිසරණ සරණ ගොස් පංච ශීලය සමාදන්ව මහා සෑය වන්දනා මාන කළේය.

හොලිවුඩ් චිත්‍ර පට නරඹන්නට මෝදන වැඩි කැමැත්තක් දැක්වූයේය. නාට්‍ය කළා. චිත්‍ර ඇන්දා... හරියට එක දිගට තවමත් කරන්නේ පොත් කියවන එක විතරයි. සෞන්දර්යයට, කලාවට, ලෝක සිනමාවට තිබූ ඇල්ම හිස ඔසවද්දී මෝදන යළි සිනමා පටි නරඹන්නට මිතුරන් හා එක් වූ අතර..... කැලිප්සෝ සංගීත කණ්ඩායමක් හා එක්ව අවන්හල්වලත් ප්‍රියසාදයන්හී ත් ගිටාරය වයමින් ගී ගායනා කළ කාලයක් ද මෝදනට තිබිණි. ඉඳහිට ඔහු නිවහනට වී කැන්වස් චිත්‍ර නිම කළේය. ඒ උදවියට විවේකීව ධර්ම සාකච්ඡා. බණ එහෙම අහන්ඩ පුළුවන්..... මෝදන සිතුවේ විවේකී දිනයක විමල බුද්ධි ලොකු හාමුදුරුවන්ගේ මුහුණු නිරූපණයක් අඳින්නටය. පොතක් කියැවීමේ වුවමනාව මෝදනට දැනිණි. නමුත්, එහි ගොස් ඔවුහු භජන් ගායනා කළහ. විශ්‍රාන්තිය වනාහි කාලත්‍රයට ම පොදු වූ ධර්මතාවකි.

අතීතයත් වර්තමානයත් අතර යම් යම් නොගැලපීම් මෙන් ම ගැලපීම් ද නැතුවා නොවේ. ඒ අතරේ බොහෝ අය සත්‍ය සොයමින් යති. මෙකී ගමන් මඟ තුළ විවිධ නිමේෂයන් හි දී මනුෂ්‍ය සත්ත්වයා අත්විඳින්නා වූ චිත්ත සන්තෘෂ්ටිය වනාහී ලෝකෝත්තර මෙන් ම ලෞකික වශයෙන් ද විවිධ මානයන් සංස්පර්ශ කරයි. ඒ සා වූ විශ්‍රාන්තිමය අත්දැකීම් සසංකාර තුළ ගැබ්ව ඇත.

කුමාර සිරිවර්ධන(2014), සසංකාර, (ප්‍රථම මුද්‍රණය), කිංකිණි ක්‍රියේෂන්, 469, හයිලෙවල් පාර , මාකුඹුර - පන්නිපිටිය.